ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

පෙරපාසල් අධ්‍යාපනය පිළිබඳ උසස් සහතික පත්‍ර වැඩසටහන 2018/2019

අවසාන පරීක්ෂණය - 2020

**ESC2315/EPA2815/EPC2815/EPE2815 - මුල් ළමාවිය සංවර්ධනය**

කාලය - පැය තුනයි.(03)

---

දිනය - 18.07.2020 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

**1** වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, **2** වන කොටසේ තෝරාගනු ලබන ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## <u>1 වන කොටස</u>

01. කායික සංවර්ධනයේ එක් මූලධර්මයක් වන *'හිස සිට දෙපතුළ දක්වා'* වන වර්ධනය පැහැදිලි කරන්න.

02. *"පරිණතිය"* යනු කුමක් ද?

03. (i) *"මව්කුස තුළ වර්ධනය"* කෙරෙහි බලපාන සාධක තුනක් (03) නම් කරන්න.

    (ii) එම එක් සාධකයක අහිතකර බලපෑම් කෙටියෙන් පැහැදිලි කරන්න.

04. *"සංකේතාත්මක චින්තනය"* යන සංකල්පය උදාහරණයක් මගින් පැහැදිලි කරන්න.

05. ළමයින්ගේ ක්‍රියාකාරකම් කෙරෙහි *"ඉගෙනුමට සූදානම"* බලපාන ආකාරය උදාහරණයක් මඟින් පැහැදිලි කරන්න.

06. පෙර පාසල් අවධියේ දී ළමයින් පෙන්නුම් කරන *"සමාජීය නොවන චර්යා රටාවන් "* හතරක් (04) නම් කරන්න.

07. (i) පෙරපාසල් අවධියේ ළමයින්ගෙන් ප්‍රකටවන"සුවිශේෂී චිත්තවේග" හතරක් **(04)** නම් කරන්න.

(ii) ඉන් එක් "චිත්තවේගී තත්ත්වයක්" **(01)** පැහැදිලි කරන්න.

08. පෙර පාසල් අවධියේ ළමයින්ගේ "ශරීර ප්‍රමාණයේ විවිධතා" කෙරෙහි බලපාන සාධක පහක් **(05)** නම් කරන්න.

(ලකුණු 5 x 8 = 40)

## <u>2 වන කොටස</u>

09. (i) ළමයින්ගේ චර්යා අධ්‍යයනයට සුදුසු "ශිල්පීය ක්‍රම" හතරක් **(04)** නම් කරන්න. (ලකුණු 04)

(ii) ඉහත සඳහන් කරන ලද එක් ශිල්පීය ක්‍රමයක් උදාහරණ ඉදිරිපත් කරමින් පැහැදිලි කරන්න. (ලකුණු 07)

(iii) බිළිඳෙකුගේ මූලික ශාරීරික අවශ්‍යතා පහක් **(05)** නම් කර ඉන් තුනක් **(03)** පැහැදිලි කරන්න. (ලකුණු 09)

10. (i) ළමයෙකුගේ "පූර්ණ පෞරුෂ සංවර්ධනය" මූලික සංවර්ධන ක්ෂේත්‍ර අනුව පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) ළමයින් තුළ ප්‍රජානන සංවර්ධනය සඳහා පෙර පාසල් ගුරුවරියට මැදිහත් විය හැකි ආකාරය උදාහරණ මගින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

11. (i) "දළ චාලක ක්‍රියා" යනු කුමක්දැයි උදාහරණ සමගින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) ළමයින්ගේ දළ චාලක ක්‍රියා කෙරෙහි බලපාන සාධක දෙකක් **(02)** උදාහරණ මගින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) ළමයින් තුළ "සියුම් චාලක කුසලතා" සංවර්ධනය කිරීම සඳහා පෙර පාසල් ගුරුවරියක විසින් සංවිධානය කළ හැකි ක්‍රියාකාරකම් පහක් **(05)** කෙටියෙන් පැහැදිලි කරන්න. ( 10 ලකුණු)

12. (i) පෙර පාසල් අවධියේ ළමයින් පෙන්නුම් කරන "යහපත් සමාජයීය චර්යා රටාවන්" පහක් **(05)** නම් කරන්න. (ලකුණු 05)

(ii) ඉහත චර්යා රටා සහිත ළමයින් නිසා පෙර පාසල් පන්තිකාමරයක් තුළ දැකිය හැකි යහපත් ලක්ෂණ උදාහරණ සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 07)

(iii) පෙර පාසල් ළමයින්ගේ සමාජීය චර්යා රටා වර්ධනය සඳහා පෙර පාසල් ගුරුවරිය කටයුතු කළ යුතු ආකාරය තර්කානුකූලව පැහැදිලි කරන්න. (ලකුණු 08)

13. (i) ළමයින්ගෙන් භාෂා සංවර්ධනයට බලපාන පරිසර සාධක පහක් **(05)** නම් කරන්න. (ලකුණු 05)

(ii) කුඩා ළමයින්ගේ භාෂා සංවර්ධනයට පවුලේ බලපෑම පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) ළමයින් තුළ යහපත් චිත්තවේග වර්ධනය සඳහා මවගේ භූමිකාව පැහැදිලි කරන්න. (ලකුණු 07)

හිමිකම් ඇවිරිණි.